කෙටි පිළිතුරු සපයන්න.

1. මාත්‍රා 2+4 තාල රූපය හදුන්වන්නේ.
2. කවි ගායනා කරනවිට හස්ත චලන පමණක් කරන්නේ.
3. නර්තනයේදී හා වාදනයේදී භාවිතවන ලය පිළිවලින් ලියන්න.
4. ගැට බෙරයේ දිග කොපමණද?
5. උඩැක්කියේ දිග කොපමණද?
6. රබානට කියන තවත් නමක් ලියන්න.
7. තම්මැට්ටම අයත් වන නාදය නම් කරන්න.
8. ගැට බෙරයේ මූලික බීජාකාර නම් කරන්න.
9. පළමු බෙර සරඹයේ නම ලියන්න.
10. පාසරඹ නැටීමෙන් පසු නටන්නේ.

ගැලපෙන පිළිතුරු යටින් ඉරක් අදින්න.

11. නර්තනයක රංග වස්ත්‍රාභරණ වලින් පිළිබිඹු වන්නේ?
    i.ආංගික ii. වාචික iii. සාන්වික iv. ආහාර්ය

12. මුහුණේ ඉරියව් වෙනස් කිරීමෙන් ඉදිරිපත් වන අභිනය කුමක්ද?
    i. ආහාර්ය ii. සාත්වික iii. වාචික iv. ආංගික

13. නර්තනයක ගායනා කොටස් අයත් වන්නේ?
    i. වාචික අභිනය ii. සාන්වික අභිනයටය
    iii. ආංගික අභිනයටය iv. ආහාර්ය අභිනයටය

14. අටදෙන අටකොන වාඩි වෙයල්ලා මෙම මෙම කවි පදය අයත් වන්නේ.
    i. පැල්කවි ii. පාරු කවි iii. ඔංචිලි වාරම් iv. නෙළුම් කවි

15. කතෘවරයෙක් නොමැතිව බිහිවූ නාට්‍ය වන්නේ?
    i. ජනකවි ii. සරල ගී iii. සන්දේශ කාව්‍ iv. නෙළුම් කවි

16. ගද්‍ය හා පද්‍ය දෙකම එකතු වී සෑදි ඇති ගායනා විශේෂය වන්නේ
    i. ටීකා සීපද ii. රබන් කවි iii. චාමර කවි iv. පැල් කවි.

17. රාජ සභාවල පවන් සැලීම සඳහා යොදාගත් උපකරණය වන්නේ
i. චාමර ii. සවරං iii. සළුව iv. අවාන

18. අනුරාධපුර යුගයේ නර්තන කලාව පිළිබඳ තොරතුරු දැකගත හැකි මූලාශ්‍රයක් වන්නේ
i. මහා වංශය ii. උම්මංග ජාතකය iii. චූලවංශය iv. එදා හෙළදිව

19. අනුරාධපුර යුගයෙන් හමුවූ කැටයමක් ලෙස හැඳින්විය හැක්කේ.

i. කුට්ටම් පොකුණේ ලෝකඩ ප්‍රතිමාව
ii. කුට්ටම්පොකුණේ එල්ලෙන අන්පහන
iii. කුට්ටම් පොකුණේ සඳකඩ පහණ
iv. කුට්ටම් පොකුණේ පෙම් යුවල.

20. නර්තනයට දක්ෂ වූ පරාක්‍රම බාහු රජතුමාගේ බිසව වූයේ
i. ලීලාවති බිසව ii.රූපවති බිසව iii. සෝමාවති බිසව iv. අනුලාවති බිසව

21. පොළොන්නරු යුගයේ සරස්වති මණ්ඩපය කර වූයේ
i. මහා පරාක්‍රම බාහු රජතුමා ii. නිශ්ශංක මල්ල රජතුමා
iii. දුටු ගැමුණු රජතුමා iv. භානිකාභය රජුය.

22. මහා පරාක්‍ර බාහු රජ කාව්‍ය ශාස්ත්‍ර ගී හා නැටුම් ඉගෙනගත් බව සඳහන් වන්නේ
i. චූල වංශයේය ii.ථූප වංශයේය iii. දෘඨ වංශයේය iv. කදවුරු සිරිතේ

23. පහන් මඩු ශාන්ති කර්මය අයත් සම්ප්‍රධාය වන්නේ
i. උඩරට ii.පහත රට iii. සබරගමු iv. භරත.

24. පඬුවස් දෙව් රජුට වැළදුන රෝගය දුරු කිරීමට කළ ශාන්ති කර්මය
i. දෙවොල් මඩුව ii.කොහොඹා කංකාරිය
iii.සූනියම් යාගය iv. පහන් මඩුව.

25. කොහොඹා කංකාරියේදී උඉරු වේශයක් මවාගත් කෙනා වන්නේ.
i. රාහු ii.කේතු iii. රවි iv. බුධ.

26. .ගාල්ල මාතර ප්‍රදේශවල වැඩි වශයෙන්දක්නට ලැබෙන ශාන්ති කර්මය වන්නේ.
i. කෙහොඹා කංකාරිය ii.දෙවොල් මඩුව iii.පහන් මඩුව iv. කිරි මඩුව.

27. සිංහරාජ වන්නම අයත් තිත් රූපය වන්නේ.
i. සුළු තනි තිත ii.මැදුම් තනි තිත iii.මහ තනි තිත iv. සුළු මැදුම් දෙතිත

28. උඩරට නර්තනයේ ප්‍රධාන නර්තන ශිල්පියෙක් වන්නේ.
i. එස්.පනිභාරතමයා ii. කෙ.එස්.ප්‍රනාන්දු මයා
iii.එම්.එච්.ගෝමස්මයා iv. සිරිබෝහාමි මයා

www.lkedu.lk

29. උඩරට නර්තනයේ ප්‍රධාන ඇදුම් කට්ටලය වන්නේ.
    i. වෙස් ඇදුම් කට්ටලය ii. දෙවොල් ඇදුම් කට්ටිලය
    iii.තෙල්මේ ඇදුම් කට්ටලය iv. පබළු ඇදුම් කට්ටිලය

30. දොම් කිට කිට දොම් බෙර පදය ප්‍රස්ථාර කළ හැක්කේ.
    i. 1234/1234 ii.123/123 iii.12/123 iv. 12/1234

31. සුළු මහ දෙනිතට අයත් වන්නම් වන්නේ.
    i. සැවුලා ii.සිංහරාජ iii.මුසලඩි iv. තුරගා

32. පෙරත් කාලෙක සිහ රජෙක් වැටුණි මහ ලිදක් තුළට ඉබි ලඹෙක් කරපු වැඩ මෙය අයත් වන වන්නම වන්නේ.
    i. සිංහරාජ ii.සැවුලා iii.තුරගා iv. හනුමා

33. ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම් තරිකිට ජිත් තරිකිට ජිත් දොම්කිට තා මෙය ගොඩ සරඹ වන කීවෙනි කස්තිරමද?
    i. 2 ii.3 iii.4 iv. 1

34. තේයි නි තානෙයි යනු.
    i. පළමු පා සරඹයි ii. දෙවන පා සරඹයි
    iii. පස්වන පා සරඹයි iv. හයවන පාසරඹයි

35. කොහොඹා කංකාරියේ පුද ලබන ප්‍රධාන දෙවියෙකු වන්නේ
    i. ඉරුගල් බණ්ඩාර ii.කතරගම දෙවි iii.පත්තිනි දෙවි iv. විෂ්ණු දෙවි.

36. කෙහොඹා කංකාරියේ පූජා විධි රටාවේ එක් අංකයක් ලෙස
    i. කජ් සිටුවීම ii.මිල්ල කැපීම
    iii.බිසෝ කජ් සිටුවීම iv. හලං වැඩමවීම

37. ගායනා රහිත නර්තන අංකයක් ලෙස හැඳින්විය හැක්කේ.
    i. වන්නම් ii.තාලම iii.සව්දම් iv. වට්ටම්

38. උඩරට වන්නම් 18 ට අයත් වන්නමකි.
    i. අනිලා ii.ගජබා iii.සිංහනාඩි iv. සිංහරාජ

39. දෝං ජීං ජීං .... මෙම බෙරපදයේ ඉතිරි කොටස වන්නේ.
    i. ගත තරි කිට ii.දොජ ජීං ජීං
    iii.තකට දොංනක iv. ජීං තරිකිට

40. උඩරට නර්තන සම්ප්‍රධායට පමණක් අවේණික පදයකි.
    i. කස්තිරම ii.අඩවීම iii.ඉරට්ටිය iv. කලාඩිම

www.lkedu.lk

2 කොටස

නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

i. මාත්‍රා 2+2+4 තුන්තිත් තාලය.....නමින් හැඳින්වේ.
ii. තාල පුහුණුවේදි සම්ප්‍රදායික භාණ්ඩ මෙන්ම.....ද යොදා ගනී.
iii. .....සඛරගමු සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය වේ.
iv. නොමදින් විකුම්පාලා ..මෙම කවිය අයත්වන්නේ .....කවි ගණයටය.
v. නර්තන නිර්මාණයේදී තාලානුකූල චලන සමග ඉදිරිපත් කළ යුතු අනෙක් චලන.....වේ.
vi. සතර අභිනයට අනුව නර්තනයේ භාවමය හැඟීම් ප්‍රකාශ කරන ප්‍රධානතම අභිනය වන්නේ..... අභිනයි.
vii. වන්නමක් ආරම්භයේදී එහි ගායන රටාව පෙන්නුම් කරන කොටස .....නමින් හැඳින්වේ.
viii. ශ්‍රී ලංකාවේ ගැමි නැටුම් අතුරින් වාදන භාණ්ඩයක් උපයෝගි කරගනු ලබන නර්තනය .....වේ.
ix. නර්තනයේදී .....මගින් රිද්මය ප්‍රකාශ වන අතර චිත්‍රයේදී .....මගින් රිද්මය ප්‍රකාශ වේ.
x. කෝලම් රගමඬල හදුන්වනු ලබන්නේ .....යනුවෙනි.එම ගැමිනාටයේම වාදනය සපයනු ලබන්නේ .....බෙරයෙනි.

2. පහත සඳහන් මාතෘකා 3 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න. (ලකුණු 12)
   i. වන්නම් ii.ගැමි නැටුම iii.පංචතූර්ය භාණ්ඩ
   iv. ආහාර්ය අභිනය v. ගොඩ සරඹ.

3. i.මානා 12/1234 තාල රූපයට අයත් බෙරපදයක් ප්‍රස්ථාර කරන්න.
   ii.එම තාල රූපයට අයත් කවි පදයක් ප්‍රස්ථාර කරන්න. (ල 12)

4. ගැමි නැටුම් හා ශාස්ත්‍රීය නැටුම් එකිනෙකට වෙනස් වූ ආකෘතියක පිහිටයි.
   I. ගැමි නැටුම් වල දැකිය හැකි ලක්ෂණ හතරක් ලියන්න.
   2. රබන් නැටුමට හා චාමර නැටුමට අදාල කවි දෙකක් ලියන්න.
   3. ගැමි නැටුමක හා ශාස්ත්‍රීය නැටුම් අතර වෙනස්කම් හතරක් ලියන්න. (ල.12)

5. 1. උඩරට නර්තන සම්ප්‍රදායට අයත් වන්නමක් නර්තනය කිරිමේදි සම්පූර්ණ කළ යුතු මූලික කොටස් පිළිවෙලින් ලියන්න.
   2.ඉහත වන්නම් නර්තනයේදී ඔබගේ අවධානය යොමු විය යුතු කරුණු 4 ක් විස්තර කරන්න.
   3.උඩරට මුසලඩි වන්නමට අයත් කවියක් ලියන්න. (ල.12)

6. 1. රූපවාහිනී නාලිකාවල විකාශනය වන වැඩසටහන් ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකිය. ඒ මොනවාද?
   2. රූපවාහිනී නර්තනයක් විචාරය කිරීමේදි අවධානය යොමු කළ යුතු නිර්නායක 4 ක් සඳහන් කරන්න.
   3. රූපවාහිනී නර්තනයක හා සජීවී නර්තනයක දැකිය හැකි වෙනස් කම් 4 ක් සංසන්දනය කරන්න. (ල.12)

www.ikedu.lk